**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2019**

**--------------------------------------**

## 1.1 තත්වාගණනය කළ මතය

**--------------------------**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම  ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය පාඨමාලා ගාස්තු ගිණුම්ගත කිරීමට අදාළව නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර ඊට අදාළව අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයට අදාළ පාඨමාලා ආදායම, කලින් ලැබුණු ආදායම හා උපචිත ආදායම පමණක් ගිණුම්ගත කර තිබුණි. | පාඨමාලා ගාස්තු සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී වාරික අය නොවූ නිලධාරියෙකුගේ රු.112,988ක් වූ ආපදා ණය හා පරිගණක ණය ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | වැඩ තහනමට ලක්කොට ඇති නිලධාරියකුට අයත් මෙම ණය ශේෂ අර්ථසාධක අරමුදලින් නිදහස් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | හිඟ ණය ශේෂ කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ අවභාවිතා කර තිබූ රු.50,338,160 ක මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතියදී මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබීමෙන් ආයතනයේ වත්කම් නිවැරදිව නිරූපනය නොවන බව නිරීක්ෂණය විය. | මූල්‍ය අවභාවිතයට අදාළ වන මෙම මුදල අය කර ගැනීමට අධිකරණයේ නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර මුදල් ලැබීමේ විශ්වාසය මත ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත. | විනය ක්‍රියාමාර්ග කඩිනම් කර, ඒ අනුව ගිණුම්වල සිදු කළ යුතු ගැලපීම් කළ යුතුය |
| (ඇ) | ආයතනය සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ප්‍රදාන ලැබීම් රු.138,594 ක් හා පර්යේෂණ ප්‍රදාන ගෙවීම් රු.140,717 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | විගණනයේදි පෙන්වා දී ඇති වෙනස්කම් හා එකඟ වේ. කෙසේ වෙතත් ප්‍රමාණාත්මක නොවන අගයන් බවද පෙන්වා දීමට කැමැත්තේමි. | ලැබීම් හා ගෙවීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මාස 05 සිට මාස 08 ක කාලයක් ඉක්මවූ රු.98,962 ක්වූ වාහන කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදලින් රු.45,172 ක් ශිෂ්‍යයන්ගෙන් අයකරනු ලබන Bench Fee වලින් අයකර ගැනීමට හා ඉතිරි මුදල් ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම වූ රු.15,428,800 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | අනධ්‍යයන සේවක වර්ජනය ඇතුළු නොවැළැක්විය හැකි හේතූන් මත මෙම පාඨමාලා ගාස්තු අය කර ගැනීමට නොහැකි වූ අතර ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ පාඨමාලා ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 ජූලි 29 දිනැති අංක 4/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය (iii) වන වගන්තිය | ස්ථාවර තැන්පතු ලේඛනය චක්‍රලේඛයට අනුකූලව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර තැන්පතු ලේඛනය අදාළ චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මුදල් චක්‍රලේඛ 04/2019 (V) වගන්තිය | ආයතනය 2019 වර්ෂයේ අවසන් වන විට ස්ථාවර තැන්පතු 33 ක් පවත්වාගෙන යනු ලබන අතර එම තැන්පතු කල් පිරීමෙන් පසු චක්‍රලේඛයට අනුව අනෙකුත් මූල්‍ය ආයතනවලින් මිල ගණන් කැඳවා ප්‍රතිලාභ වැඩිම ආයතනයේ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු කල්පිරීමේදී ප්‍රධාන රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවා ආයෝජනය කිරීමට 2020 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,804,151 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.76,889,677 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.36,085,526 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පෞද්ගලික පඩිනඩි වියදම රු.11,017,794 කින් වැඩිවීම හා විදේශ විනිමය අනුපාතය වෙනස්වීම රු.26,036,314 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබූ අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2015 වර්ෂයේ රු.96,051,739 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී එය රු.134,781,277 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 හඳුනාගත් පාඩු**

**----------------**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් 2019 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා විවෘත මිල ගණන් කැඳවීමේදී නිසි සැලකිල්ලකින් සහ අවධානයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම් පළ කිරීම නිසා පළමු පුවත්පත් දැන්වීම පළ කිරීම වෙනුවෙන් වැය කරන ලද රු.49,335 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව ගොඩනැගිලි ත්‍රිත්වය සඳහාම එකවර මිල ගණන් කැඳවුවද, නව ගොඩනැගිල්ල විවෘත කිරීමට ප්‍රමාදවීම මත මෙම තත්ත්වය ඇති වූ අතර මෙය අනපේක්ෂිත තත්ත්වයකි. | ප්‍රසම්පාදන කටයුතු නිසි අවධානයෙන් යුතුව සිදු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සතු වාහන 4ක ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත රු.10,000 ක් ගෙවා පරීක්ෂා කර තිබුණද 2019 වර්ෂය අවසන් වන විටත් රියදුරන් විසින් එම පරීක්ෂාවෙන් අනුමත අනුපාතයට වඩා වෙනස් අනුපාතයන් යටතේ දෛනික ධාවන සටහන්වල ඉන්ධන පරිභෝජනය සටහන් කර තිබුණි. | අදාළ විචලනයන් නිවැරදි කර ගැනීමට රියදුරුමහතුන් දැනුවත් කරන ලදි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුගත විය යුතුය. |
| (ආ) | ආයතනය 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා ගබඩා භාරකරු ඇතුළුව නිලධාරීන් 06 දෙනෙකු සමීක්ෂණ මණ්ඩලය ලෙස පත් කර සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව සමීක්ෂණය සිදුකළ බවට තහවුරු නොවුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට මෙම වර්ෂයේ සිට නියමිත පරිදි තුලනය කිරීමේ සටහන් යෙදීමට කටයුතු කරමි. | භාණ්ඩ සමීක්ෂණය හා සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම මුදල් රෙගුලාසිවලට අනුව සිදු කළ යුතුය. |
| (ඇ) | 2015 අප්‍රේල් 09 දිනැති අංක 914 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත කරන ලද විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යාපන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයේ 5 වන වගන්තිය අනුව ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතර ද්වි සම්බන්ධතාවය අනාවරණය කර ගැනීමට හෝ මේ මඟින් තත්ත්ව පාලනයට ඇති වියහැකි අහිතකර තත්ත්වයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සකස් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද සිසුන් විසින් සහ ආචාර්ය මණ්ඩලය විසින් පිරවිය යුතු පෝරම 02 ක් හඳුන්වා දීමට කටයුතු කෙරෙනු ඇත. | අදාළ මාර්ගෝපදේශයන්ට කඩිනමින් අනුගත විය යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වෙනි නිර්නායකය අනුව උත්තර පත්‍ර ඇගයීම සඳහා උත්තර පත්‍ර දෙවෙනිවර හරි වැරදි බැලීමේ | අප ආයතනය සතුව පූර්ණකාලීන ස්ථිර ආචාර්යවරු දෙදෙනෙක් පමණක් සිටින බැවින් උත්තර පත්‍ර දෙවෙනිවර පරීක්ෂා කිරීම අසීරු වී ඇති අතර යම් ගැටලුකාරී අවස්ථාවලදී ඒ සඳහා අප ආයතනයට පහසුකම් සපයා දිය හැකිය. | අදාළ මාර්ගෝපදේශයන්ට කඩිනමින් අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රමවේදයන් අභ්‍යන්තරව හඳුන්වාදිය යුතු අතර එය පාලක සභාවෙන් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කර ගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | ආයතනය විසින් පවත්වනු ලබන විභාග, සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩි දියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයන් සහ ප්‍රමිතීන් සකස් කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ආයතනය විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්යය ඉතාමත් නිවැරදි හා විනිවිධභාවයෙන් සිදු කරනු ලබයි. එසේම ආයතන විසින් පවත්වාගෙන යනු ලබන සියළුම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් අනුමැතිය ලබා ගෙන ඇති අතර ප්‍රතිඵල ශ්‍රේණිගත කිරීම, සමාලෝචනය කිරීම පිළිගත් ප්‍රමිතියකට සිදු වේ. කෙසේ වෙතත් අවශ්‍ය ලිපි ලේඛන ආයතනය යටතට පවරා ගැනීමට කඩිනමින් කටයුතු කරන්නෙමු. | අදාළ මාර්ගෝපදේශයන්ට කඩිනමින් අනුගත විය යුතුය. |
| (ඊ) | ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවන්ට අදාළව පවත්වනු ලබන විභාගවල උත්තර පත්‍ර පරීක්ෂා කිරීම සඳහා ලකුණුදීමේ පරිපාටියක් (Marking scheme) සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලකුණු ලබාදීමේ පටිපාටිය සහ උත්තර පත්‍ර ආදිය අදාල උත්තර පත්‍ර පරීක්ෂකයන් සතුව පවතින අතර ඒවා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යටතට ගැනීමට වහාම කටයුතු කරමින් පවතී. | අදාළ මාර්ගෝපදේශයන්ට කඩිනමින් අනුගත විය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් 2019 වර්ෂයේදී පවත්වන ලද පශ්චාත් උපාධි පාඨමාලා 11 ක් සඳහා බාහිර දේශකවරුන් 139 දෙදෙනෙකු වෙනුවෙන් රු.18,519,579 ක මුදලක් ගෙවා ඇතත්, එම දේශකවරුන්ගේ සේවය නිසි ලෙස ලැබුණේද යන්න තහවුරු කර ගැනීම සඳහා ශිෂ්‍යයන්ගෙන් ඇගයීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අනාගතයේදී ඒ ඒ දේශකවරුන්ගේ සේවය පිළිබද ශිෂ්‍යන්ගේ ඇගයීම් පත්‍ර විධිමත් ක්‍රමවේදයක් හරහා ලබාගෙන මෙම ආයතනයේ ගබඩා කර තැබීමට කටයුතු කරනු ඇත. | බාහිර දේශකවරුන්ගේ සේවය ඇගයීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලට අදාළ උත්තර පත්‍ර ඇගයීම සඳහා මණ්ඩලයක් (Exam Evaluation Panel) පත් කිරීමට හා පරීක්ෂා කරන ලද උත්තර පත්‍ර ආරක්ෂිතව ගබඩා කිරීම | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන විභාග වලට අදාල උත්තර පත්‍ර ඇගයීමේ මණ්ඩල (Exam Evaluation Panel) 11 ක් පිහිටුවා ඇත. උත්තර | උත්තර පත්‍ර ගබඩා කිරීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් කඩිනමින් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | පත්‍ර දැනට ඒ ඒ දේශකවරුන් ළඟ ආරක්ෂිතව ගබඩා කර ඇතත් අනාගතයේ දී සියළු උත්තර පත්‍ර මෙම ආයතනයේම ආරක්ෂිතව ගබඩා කර තැබීමට ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත. | |
| (ඇ) | 2019 වර්ෂයේදී පර්යේෂණ ප්‍රදාන යටතේ මිලදී ගෙන තිබූ රු.562,027 ක් වටිනා උපකරණ 23 ක් විධිමත් පරිදි ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ප්‍රධාන යටතේ මිලදී ගනු ලබන උපකරණ අප විසින් වෙනම ඉන්වෙන්ට්‍රි රෙජිස්ටරයක ලේඛණ ගත කරනු ලබන අතර පෙන්වා දී ඇති වත්කම් සටහන් කරන ලද ඉන්වෙන්ට්‍රි රෙජිස්ටරයේ පිටපතක් මේ සමග ඉදිරිපත් කොට ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් ලේඛනයක් නඩත්තු කළ යුතුය. |
| (ඈ) | 2017 හා 2019 වර්ෂවලදී ආරක්ෂිත කැමරා 20 ක් ස්ථාපිත කිරීම සඳහා රු.813,649 ක් වැය කර තිබුණද එම කැමරාවල දත්ත ගබඩා කළ හැකි කාල සීමාව දින 21 ක් තරම් අඩු කාලයක් විය. | ඉදිරියේදී Hard Disk Capacity වැඩිකොට දත්ත ගබඩා කලහැකි දින ගණන 90 දක්වා වැඩි කිරිමට කටයුතු කරමි. | ප්‍රසම්පාදනයේදී ඵලදායීතාවය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | ආයතනය විසින් 2019 වර්ෂයේදී පවත්වන ලද කෙටිකාලීන පාඨමාලා/වැඩමුර පිළිබඳ නියැදි පරීක්ෂාවකදී පාඨමාලාවන් 03 ක් සම්පූර්ණ කරන ලද සිසුන්ගෙන් අයවිය යුතු රු.640,000 ක හිඟ පාඨමාලා ගාස්තු අය කර ගැනීමකින් තොරව එම පාඨමාලාවලට අදාළ සහතික පත්‍ර ප්‍රදානය කර තිබුණි. | පාඨමාලා තුනට අදාලව රු. 640,000 මුදල අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | පාඨමාලා සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගත යුතුය. |
| (ඊ) | එක් බැංකුවක ස්ථාවර තැන්පතු 24 ක් පවත්වාගෙන යනු ලබන අතර ආයතනයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තැන්පත් සහතික ප්‍රමාණය අඩුකර ගෙන මූල්‍ය අක්‍රමිකතා සිදු වීමට ඇති ඉඩකඩ අවම කර ගැනීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | අදාළ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයන් ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ආයතනයේ අවශ්‍යතාවය අනුව එක් බැංකුවක පවත්වාගෙන යනු ලබන ස්ථිර තැන්පතු ප්‍රමාණය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදු කර නොතිබුණු පර්යේෂණ ව්‍යාපෘති 03 ක වර්ෂය අවසාන ශේෂය රු.227,714 ක් වූ අතර පර්යේෂණ කටයුතු අවසන් වූ ශේෂ පියවීමට හෝ පර්යේෂණ කටයුතු වෙනුවෙන් වැය කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘතිවල ශේෂයන් හැකි ඉක්මනින් නිරවුල් කිරීමට හෝ නිසි අනුමැතියක් ගත්පසු පර්යේෂණ අරමුදලට මාරුකිරීමට ඉදිරියේදි කටයුතු කරමි. | අරමුදල් කඩිනමින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ හා ශිෂ්‍යත්ව පහසුකම් ලබාදීම සඳහා ආරම්භ කර ඇති අරමුදලෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබූ අතර වර්ෂය අවසන් වන විට එම අරමුදලේ රු.8,038,458 ක ශේෂයක් විය. | මෙම මුදල් උපයෝජනය කිරීමට අදාල කටයුතු මේවන විට සම්පාදනය වෙමින් පවති. | අරමුදල් කඩිනමින් උපයෝජනය කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය අවසන් වන විට ආයතනය සඳහා වාහන 04 ක් අනුයුක්ත කර තිබුණද එක් රියදුරෙකු පමණක් සේවයේ නියුක්ත වීම නිසා ආයතනය සතු වාහන 03 ක් ඌන උපයෝජනව පැවතීම හේතුවෙන් දෛනික කටයුතු වලට දැඩි බාධාවක් වී තිබුණි. | මෙම ආයතනයේ ක්‍රියාකාරකම් සපිරීමට වාහන හතරක් සඳහා රියදුරුවරුන් දෙදෙනෙකුගේ සේවය ඉතාම කාර්යක්ෂම ලෙස අප ලබාගන්නා අතර ඉදිරි කාලයේ දී අවශ්‍ය වුවහොත් උපදෙස් පරිදි ක්‍රියාකර තවත් රියදුරු මහතෙකු බඳවා ගැනීමට කටයුතු කළ හැක. | පුරප්පාඩු තනතුරු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේදී අනුමත කාර්යය මණ්ඩලයට අනුව අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේ තනතුරු 11 ක නිලධාරීන් 15 දෙනෙකුගේ පුරප්පාඩු හා තනතුරු 03 ක අතිරික්ත නිලධාරීන් 07 දෙනෙකු පැවතුණි. ආයතනය පවත්නා පුරප්පාඩු වූ තනතුරු කඩිනමින් පුරවා ගැනීමට සහ අවශ්‍යතාවය අනුව අතිරික්ත තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමට හෝ එම නිලධාරීන් වෙනත් ආයතන සඳහා ස්ථාන මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට කාර්යය මණ්ඩලය අනුමත වී වසර 02 කට අධික කාලයක් ගත වී ඇතත් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ආයතනයේ සේවක මණ්ඩලය යාවත්කාලීන කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | පුරප්පාඩු සහ අතිරික්ත තනතුරු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |